# "සෙනෙහසයි - පාසලයි" සමාජ සංවර්ධන වැඩසටහන

1. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- තවලම
2. තෝරාගත් පාසල :- ගා/ඕපාත මහා විද්‍යාලය
3. පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව :- 854
4. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාල සීමාව:- වර්ෂ එකකි.( 2024)
5. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට දායක වූ නිලධාරීන්:-

- ✓ **ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර**
- ✓ **මුල් ළමාවිය නිලධාරි**
- ✓ **වනිතා සංවර්ධන නිලධාරි**
- ✓ **උපදේශන නිලධාරි**
- ✓ **විදේශ සේවා සංවර්ධන නිලධාරි**
- ✓ **මත්ද්‍රව්‍ය නිවාරණ නිලධාරි**
- ✓ **වතු ආශ්‍රිත සංවර්ධන නිලධාරී**
- ✓ **පරිසර නිලධාරී**
- ✓ **කෘෂිකර්ම සංවර්ධන නිලධාරී**
- ✓ **ඉඩම් පරිහරණ සංවර්ධන නිලධාරී**
- ✓ **ප්‍රාජා විශෝධන සංවර්ධන නිලධාරි**
- ✓ **දේශීය වෛද්‍ය සංවර්ධන නිලධාරී**
- ✓ **සමෘ සංවර්ධන නිලධාරි**
- ✓ **කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරී**
- ✓ **ඵලදායිතා සංවර්ධන නිලධාරී**
- ✓ **මානව සම්පත් සංවර්ධන නිලධාරි**
- ✓ **නිපුණතා සංවර්ධන නිලධාරීන්**
- ✓ **ජාතික ඒකාබද්ධතා සංවර්ධන නිලධාරි**
- ✓ **අපනයන සංවර්ධන නිලධාරී**
- ✓ **සංස්කෘතික නිලධාරි**
- ✓ **සමාජ ආරක්ෂණ නිලධාරී**

6. ව්‍යාපෘතිය සැකැස්ම සකස් කිරිම :- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇත.
7. ඉලක්කගත කණ්ඩායම :- පාසලේ සියලුම දරුවන් , දෙමව්පියන් හා ගුරුවරුන් මෙහි ඉලක්කගත කණ්ඩායම වේ.
8. අපේක්ෂිත ඉලක්ක ලඟාකරගත් ආකාරය :-

   පාසලේ දරුවන් දෙමාපියන් සදහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරීන් විසින් එක්එක් විෂයට අදාල වැඩසටහන් වෙන වෙනම හදුන්වා දෙමින් ඒ සදහා පාසලේ අදාල ගුරුභවතකු තෝරා ගැනිම සිදුවිය. නිලධාරීන් කණ්ඩායම් වශයෙන් විවිධ වැඩසටහන් සංවිධානය කල අතර එම වැඩසටහන් මඟින් සපුරාගත් ඉලක්ක පහත පරිදි වේ.

## 8.1.සුන්දර විදුබිම

වැඩසටහන සඳහා තෝරා ගත් ගා/ඕපාත මහා විද්‍යාලය පිහිටා ඇත්තේ කඳුකර භූමියක බැවින් ඉඩම් පරිහරණ නිලධාරී උපදෙස්මත භූමිය පරිහරණය සම්බන්ධ සැලසුම් කර භූමිය අලංකරණය ස්ථානයක් බවට පත්කිරිමට කටයුතු කර ඇත.

අපේක්ෂිත ඉලක්ක :- "පාසල් භූමිය" ඵලදායි ලෙස යොදා ගැනිම.

යෙදවුම් :- මිනිස් ශ්‍රමය, මූලික බිම් සකස් කිරීමේ උපකරණ (උදළු, අලවංගු ......ආදිය)

ක්‍රියාකාරකම් :-

I. ඉඩම් පරිහරණ නිලධාරී උපදෙස්මත භූමිය සකස් කිරීමේ මූලික සැලසුම ලබා ගැනිම.
II. කෘෂිකර්ම සංවර්ධන නිලධාරීගේ උපදෙස් හා මඟ පෙන්වීම අනුව බෝග වර්ග සිටුවීම.
III. පන්ති අනුව ඒඒ බෝග වර්ග රැකබලා ගැනිම හා නඩත්තු කටයුතු සිසුන් වෙත පැවරීම.
IV. වගාවේ අස්වනු ගුරුමණ්ඩලය හා දෙමාපියන් වෙත අලවිකිරීම සඳහා ක්‍රමවේදයක් සැකසිම.

නිමැවුම් :-

- ✓ ඉතාමත් අලංකාරවත් ,ඵලදායී පාසල් පරිසරයක්.
- ✓ ක්‍රමානුකූල වගාභූමියක්
- ✓ හරිත පරිසරයක්
- ✓ වසවිෂ රහිත ඵලදාවක්

ළඟාකරගත් ඉලක්ක:- පාසල් භූමිය අලංකාරවත් ,ඵලදායී ස්ථානයක් බවට පත්වීම.






## 8.2.නිකසල විදුබිම

**අපේක්ෂිත ඉලක්ක :- කසලින් තොර පාසල් පරිසරයක්**

**යෙදවුම් :- මිනිස් ශ්‍රමය (ප්‍රජා විශෝධන නිලධාරී යටතේ සිටින ආඥාලාභීන්), කෘෂි උපකරණ (උදළු, අලවංගු ......ආදිය)**

**ක්‍රියාකාරකම් :-**

I. පාසල තුළ කසල කළමනාකරණ කටයුතු නිසිපරිදි සිදු නොවීම හා පාසල් භූමියට අඩුපාඩුවක්ව පැවති කසල බැහැර කිරීමේ ස්ථානයක් සැකසීම.

II. කසල කොටු නිර්මාණය කිරීම

- ✓ නිමැවුම්:- පාසල තුළ පොලිතීන්
- ✓ ළඟාකරගත් ඉලක්ක:- කසල බැහැරකරන ස්ථිර ස්ථානයක් නිර්මාණය







## 8.3.සුවපත් මනසක්

**අපේක්ෂිත ඉලක්ක:- යහපත් මනෝ සමාජීය පරිසරයක් ගොඩනැගීම තුළින් සැහැල්ලු ඉගෙනුම් පරිසරයක් ගොඩනැගීම.**

**යෙදවුම් :- බීම බට,ඩිස්පොසිබල් කප්,හණනූල්, A 4 කොළ,පැස්ටල් පාට**

**ක්‍රියාකාරකම් :-**

I. දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම
II. ළමුන් සඳහා ක්‍රියාකාරකම් පදනම් කරගත් පුහුණු වැඩසටහන් පැවැත්වීම.

**නිමැවුම් :-**

I. යහපත් දෙමාපිය පරිසරයක් ගොඩනැගීම තුළින් ඉගෙනුම් ඵලදායිතාවය ඉහළ නැංවිම.
II. දෙමාපියභාවය පිළිබඳ සත්ආකල්ප ස්ථාපිත කිරිම

**ළඟාකරගත් ඉලක්ක :-**

දරුවන්ගේ අධ්‍යාපනයට අහිතකර ලෙස බලපෑ දෙමාපිය පරිසරයේ පැවති ගැටලු උපදේශන සේවාවවෙත යොමුකර ගැනිම තුළින් ළමුන්ගේ මානසික සෞඛ්‍ය ඉහළ නැංවිමට හැකිවිම






## 8.4.සැමට සාක්ෂරතාවය

**දරුවන්ගේ අධ්‍යාපන අයිතිය සහතික කිරිම වෙන්වෙන් සැමට සමසේ ඉගෙනිමට අවස්ථාව සලසා දෙන ගා/ ඕපාත මහා විද්‍යාලයේ දූර්වල සාක්ෂරතාවයක් සහිත දරුවන් වෙනුවෙන් මෙම වැඩසටහන සංවිධානය කරඇත. ඒ අනුව අකුරු ලිවිමේ කියවීමේ දූර්වලතා සහිත දරුවන් සදහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරී මහත්ම මහත්මින් විසින් පාසල් වේලාවෙන් පසු සතියකට දින තුන බැගින් පවත්වන ලදී.**

**අපේක්ෂිත ඉලක්ක :- පාසලේ සියලුම දරුවන්ට ලිවිම හා කියවීමේ හැකියාව වර්ධනය.**

**යෙදවුම් :- වයිට් බෝඩ්, මාකර්, පිංතූර කාඩ්, පිංතූර කොළ, පත්තර, බ්‍රිසිල් බෝඩ්**

**ක්‍රියාකාරකම් :-**

I. පාසල මඟින් හදුනා ගත් අකුරු ලිවිමේ හා කියවීමේ දූර්වලතා සහිත දරුවන් හදුනා ගැනිම.
II. ප්‍රායෝගිකව දරුවන්ට අකුරු හදුනා ගැනිම සදහා පිංතූර කාඩ් , අකුරු කාඩ්, භාවිත කිරිම
III. පාසල් කාලයෙන් පසු එම දරුවන් සදහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලිය නිලධාරීන් විසින් අමතර පංති පැවැත්විම

**නිමැවුම්** :- තෝරාගත් ඉගෙනුම් දූර්වලතා සහිත දරුවන් සදහා මූලික ලිවිමේ හා කියවීමේ හැකියාව වර්ධනය කිරීම

**ළඟාකරගත් ඉලක්ක** :- වර්ෂ අවසානය වනවිට පාසලේ සියලුම දරුවන්ට අකුරු ලිවිමේ හා කියවිමේ හැකියාව පැවතීම.

| ළමයාගේ නම | වයස හා උපන් දිනය | භාරකරුගේ නම සහ ලිපිනය |
|---|---|---|
| කේ.ධම්මික රුවන් කුමාර | අවු.11 - 2012.04.04 | කීර්ති කුමාර,මිහිදු වත්ත,ඕපාත |
| කේ.අජිත් කුමාර | අවු.15 - 2008.11.04 | කීර්ති කුමාර,මිහිදු වත්ත,ඕපාත |
| ජේ.අජිත් කුමාර | අවු.14 - 2009.08.07 | ආර්.ප්‍රසන්න,මිහිදු වත්ත,ඕපාත |
| පී.අසංක ප්‍රදීප් කුමාර | අවු.11 - 2012.08.23 | පී.ජේරාම්,කයිවත්ත,හල්ගහවල පාර,ඕපාත |
| එම්.මධුශංඛ | අවු.12 - 2011.12.19 | පී.බණ්ඩාර,සරත් මහතාගේ වත්ත,ඕපාත |
| කේ.රගුමාන් | අවු.11 - 2012.07.09 | කන්නයියා රාමචන්ද්‍රන්,ජයවර්ධනවත්ත,පාසල අසල,ඕපාත |
| එම්.කේ.දිලානි | අවු.10 - 2013.05.13 | ලෙච්චමන් කරුණාකරන්,උපනන්දමහතාගේ වත්ත,ඕපාත |
| ආර්.සාවිත්‍රි කුමාරි | අවු.11 - 2011.05.29 | රත්නම් රාමර්, සරත් මහතාගේ වත්ත,ඕපාත |
| එම්.මධූෂා | අවු.09 - 2014.12.30 | එම්.ලෙච්චමන්,පොල්හේනවත්ත,ඕපාත |
| එල්.කේ.දිල්මි අප්සරා | අවු.5 -2018.03.26 | ලෙච්චමන් කරුණාකරන්,උපනන්දමහතාගේ වත්ත,ඕපාත |
| එන්.වාසනා සෙව්වන්දි | අවු.17 - 2006.07.10 | නඩරාජා,සමන් කඩේ වත්ත,හල්ගහවල,ඕපාත |
| එස්.මධුශානි | අවු.10 - 2013.07.17 | කන්නයියා රාමචන්ද්‍රන්,ජයවර්ධන වත්ත,පාසල අසල,ඕපාත |
| කේ.විදූර සම්පත් | අවු.08 | පුෂ්පනාදන්, හල්ගහවල,ඕපාත |
| කේ.ආකාශ් | අවු.10 | කේ.රාමනාදන්,පතිරණ මහතාගේ වත්තබානගල පාර,ඕපාත |











## 8.5.විදුබිමට ඔසු උයනක්

මෙම වැඩසටහන යටතේ දරුවන් විසින් හඳුනා නොගත් ඖෂධ පැළ ඔවුන්ට හඳුන්වා දිම හා ඔසු පැළ සිටුවීම සඳහා දරුවන්ගේ සහයෝගය ලබා ගන්නා ලදී. දරුවන් සමඟ පාසල් භූමිය තුළ දෙළුම්, කොහොඹ, ආඩතෝඩ , රත්නටොල්,කුඹුක්, නා යන ඖෂධ පැළ වගා කිරීම සිදුවිය.

අපේක්ෂිත ඉලක්ක:- :-

I. දේශීය ඔසුපැළ පිළිබඳ දරුවන් දැනුවත් කිරීම.
II. පාසල් දරුවන් තුළ ඔසු වගාව පිළිබඳ යහපත් ආකල්ප වර්ධනය කිරිම

යෙදවුම්:- ඔසු පැළ, මිනිස් ශ්‍රමය , කෘෂි උපකරණ (උදළු, අලවංගු ......ආදිය)

ක්‍රියාකාරකම් :-

I. ඔසුපැළ වගා කිරිමට අදාල භූමිය සැකසිම
II. ඔසුපැළ ප්‍රවාහනය
III. දරුවන් ලවා ඔසුපැළ සිටුවිම
IV. ඔසුපැළ සඳහා සෙවන සැපයිම
V. පැළ නඩත්තු කිරිම සඳහා පාසල් ශිෂ්‍ය නායක මණ්ඩලයේ දරු දැරියන් සඳහා භාර දිම සිදු කර ඇත.

නිමැවුම් :- ඔසු උයනක් නිර්මාණය කිරිම

ළඟාකරගත් ඉලක්ක:-

I. පාසල් දරුවන් තුළ ඔසු වගාව පිළිබඳ අවබෝධයක් හා උනන්දුවක් ඇති විම
II. දරුවන් හඳුනා නොගත් නව ඖෂධ වර්ග හඳුනා ගැනිම







## 8.6.විදුබිමෙන් ව්‍යවසායකයෙක්

**මේ සඳහා පාසලේ අ.පො.ස සාපෙළ විභාගය සඳහා පෙනි සිටි දරුවන් යොදා ගන්නා ලදි. එම දරුවන් අනාගතයේ අධ්‍යාපනයෙන් ඔබ්බට ගොසින් රටෙහි සංවර්ධනයට වෙනුවෙන් දායකත්වය ලබා ගැනිම අපේකෂා විය.**

**අපේක්ෂිත ඉලක්ක :- විදුබිමෙන් ව්‍යවසායකයෙක්.**

**යෙදවිම්:-** බහු මාධ්‍ය, ලැප්ටොප් , **A4,** පෑන් පැන්සල්,

**ක්‍රියාකාරකම් :- දරුවන්ගේ බුද්ධි වර්ධන ආකල්ප සඳහා ක්‍රියාකාරකම් (විවිධ චරිත උපයෝගිකර ගනිමින් ව්‍යවසායකයා දරුවන් තුළින් ඉස්මතු කිරීම.)**

**නිමැවුම්:- අනාගත සාර්ථක ව්‍යවසායකයෙක් බිහිවීම.**

**ළඟාකරගත් ඉලක්ක:-**

I. **ව්‍යවසායකත්ව සංකල්ප පිළිබඳව දරුවන් දැනුවත් කිරීම.**
II. **විව්‍යසායකත්ව සංකල්ප පිළිබඳව දරුවන් තුළ නව ආකල්ප බිහිවීම.**






## 8.7.අපි ආසයි ලොව දිනන්න

පාසලට ඇතුලත් කරන ලද දරුවන්ගේ උප්පැන්න සහතික නොමැති විම හේතුවෙන් ඇති වන ගැටලු වෙනුවෙන් විසඳුම් ලබාදිම මෙහිදි සිදුවු අතර දරුවන්ගේ දෙමාපියන් විවාහකර දිම හා ඔවුන්ගේ උප්පැන්න සහතික ලබාදිම වෙනුවෙන් මූලික කටයුතු සම්පාදනය කරනලදි.

**අපේක්ෂිත ඉලක්ක:- උප්පැන්න සහතික නොමැති පාසල් දරුවන් සඳහා උප්පැන්න සහතික ලබාදිමට අවශ්‍ය කටයුතු සම්පාදනය**

**යෙදවීම්:- මානව ශ්‍රමය, ලිපි ද්‍රව්‍ය,**

**ක්‍රියාකාරකම් :-**

- **පාසලේ උප්පැන්න සහතික නොමැති දරුවන් හදුනා ගැනිම**
- **හදුනාගත් දරුවන්ගේ දෙමාපියන් සදහා උප්පැන්න සහතික සැකසිමට අවශ්‍ය ලිපි ලේකන පිළිබඳ දැනුවත් කිරිම හා ඒවා සපයා ගැනිමට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වා දීම.**
- **උප්පැන්න නොමැති දරුවන් සියළුදෙනාගේ දෙමාපියන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කැඳවා උප්පැන්න සැකසිමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගැනීම.**

**නිමැවුම්:- පාසලේ සියළුම දරුවන්ට උප්පැන්න සහතිකයක හිමිකම ලබාදිම**

**ළඟාකරගත් ඉලක්ක:-දරුවන් හයදෙනෙකුගේ උප්පැන්න සැකසීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය**

**2024 වර්ෂය තුළ උප්පැන්න සකස්කිරීමට කටයුතු කල දරුවන්**

| අනු අංකය | දරුවාගේ නම | භාරකරුගේ නම |
|---|---|---|
| 1 | ඩබ්.එම් ලක්ෂිත | ඉන්ද්‍රජිත් ලක්මාල් මයා |
| 2 | සන්දනන් විජේකුමාර | සන්දනන් ගනේෂන් මයා |
| 3 | අනුෂා දමයන්ති | රාමචන්ද්‍රන් ගනේෂන් මයා |
| 4 | සෙල්වදොරේ ප්‍රසන්න | සින්නප්පම් අන්නගිලි මිය |
| 5 | සෙල්වදොරේ ක්‍රිෂාන්තන් | සින්නප්පම් අන්නගිලි මිය |
| 6 | එච්.ටි.ජයනි උදේශිකා | එච්.ටී.සුසන්ත මයා |





## 8.8.පාසලෙන් පසු වෘත්තීය මාර්ගෝපදේශනය

**අපේක්ෂිත ඉලක්ක:-** වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දරුවන් තුළ දැනුවත්භාවය ලබා දීම.

**යෙදවුම්:-** මානව ශ්‍රමය, ලිපි ද්‍රව්‍ය,

**ක්‍රියාකාරකම් :-**


මෙහිදී පාසලේ අ.පො.ස සා.පෙළ අවසන් කල සිසුන් සඳහා මාර්ගගත ක්‍රම භාවිත කරමින් බහුවිධ බුද්ධිපරීක්ෂණය, හැකියා ලැදියා පරීක්ෂණය හා අ.පො.ස සා.පෙ. විෂයන් තෝරා ගැනීමට දරුවන් සඳහා මඟපෙන්වීමේ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

**නිමැවුම්:-** දරුවන්ට අනාගතයට ගැලපෙන වෘත්තියන් තෝරා ගැනීමට මඟපෙන්වීම.

**ළඟාකරගත් ඉලක්ක:-** අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය අසමත් වුවද දරුවන් තමාට ගැළපෙන වෘත්තීය විෂයන් තෝරා ගැනීමට හැකියාව ඇති කිරීම.











## 8.9.අනාගත නායකයන් සඳහා සමථකරණය

**මෙහිදී දරුවන් සඳහා සාකච්ඡා මාර්ගයෙන් ගැටුම් නිරාකරණය පිළිබඳ දැනුවත් කිරීම ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිතව සිදු කරන ලදී.**

**අපේක්ෂිත ඉලක්ක:-** ගැටුම් අවම පාසල් පද්ධතියක් බිහිකිරීම

**යෙදවුම්:-** බහු මාධ්‍ය, ලැප්ටොප් , **A4,** පෑන් පැන්සල්,

**ක්‍රියාකාරකම් :-**

දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන

I. ප්‍රායෝගික ක්‍රියාකාරකම් (අත් ගැටය, තිත් නවය ක්‍රියාකාරකම..)

II. සාකච්ජාව මඟින් ගැටුම් නිරාකරණය කරගන්නා ආකාරය පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම් මඟින් අත්දැකීම් ලබාදීම.


**නිමැවුම්:-** ගැටුමක් ඇති වූ විට එය සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනිම

**ළඟාකරගත් ඉලක්ක:-**

I. එකිනෙකා අතර සහජීවනයෙන් යුතුව ක්‍රියා කිරීම

II. සාකච්ඡා මාර්ගයෙන් ගැටුම් නිරාකරණය කර ගැනිම




## 8.10.විදුතරු අභිමන්

**අපේක්ෂිත ඉලක්ක:- දරුවන්ගේ ඉගෙනුම් කුසලතා හා බාහිර ක්‍රියාකාරකම් ඇගයිමට ලක් කිරිම**

**යෙදවුම්:- මානව ශ්‍රමය, ඇගයුම් සහතික , සමරු තිළිණ, නිල ලාංඡන**

**ක්‍රියාකාරකම් :-**

- ❖ සෙනෙහසයි පාසලයි වැඩසටහනට සමගාමීව වැඩසටහනට සහභාගී වීම නිමිත්තෙන් දරුවන් සදහා ඇගයුම් සහතිකයක් ලබාදිම.
- ❖ සාහිත්‍ය, ක්‍රිඩා හා සෞන්දර්යාත්මක හැකියාවන් සහිත දරුවන් සදහා විශේෂ සමරු ලාජංන පැළදවිම.
- ❖ ප්‍රාදේශීය සාහිත්‍ය තරගාවලියේ දක්ෂතා දැක්වූ දරුවන් ඇගයීමට ලක්කරන ලදී.

**නිමැවුම්:- දරුවන්ගේ දක්ෂතා ඇගයිම වෙනුවෙන් සැමරුම් උළෙලක් සංවිධානය**

**ළඟාකරගත් ඉලක්ක:-**

- ❖ දරුවන් අඛණ්ඩව වැඩසටහන සමග සම්බන්ධ කරගත හැකිවිම.
- ❖ ඉගෙනුම කටයුතු සදහා මෙන්ම පාසලේ බාහිර ක්‍රියාකාරකම් සදහා සක්‍රිය සහභාගීත්වය











## 8.11.ගුණාත්මක වැඩ පරිසරයකට එලදායිතාව

වැඩසටහන 01

I. අපේක්ෂිත ඉලක්ක:- එලදායීතා සංකල්පය පිළිබඳ දැනුම ලබා දෙමින් , ආකල්ප, කුසලතා වලින් සපිරි දරු පිරිසක් අනාගතයට බිහිකිරිම

II. යෙදවුම්:- බහු මාධ්‍ය, ලැප්ටොප් , A4, පෑන් පැන්සල්,

III. ක්‍රියාකාරකම් :-

1. දෛනික දින චර්යාව සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරිම
2. නිවසේ පාඩම් මේසය සකසා ගැනිම
3. පාසල් උපකරණ හා නිවස පිළිවෙලට සකසා ගන්නා ආකාරය ප්‍රදර්ශණය කිරිම
4. ආදායම් වියදම් ගණනය කරන ආකාරය පිළිබඳ දැනුවත් කිරිම

IV. නිමැවුම්:-

1. දෛනික පාඩම් කාලසටහන් නිර්මාණය කර ගැනිම
2. ගෘහස්ථ පරිසරය නිර්මාණශීලිව සකස්කර ගැනිම

V. ළඟාකරගත් ඉලක්ක:-

දරුවන්ට දෛනිකව චර්යාවන් සිදුකිරීමට සඳහා වන සැලසුම් පිලිබදව දැනුවත් කිරීම මඟින් දරුවන්ට තම වටිනාකමක,පවුලේ වටිනාකම,සමාජයේ වටිනාකම,රටේ වටිනාකම පිලිබද ව දැනුමැති දරුවෙකු බිහිවීම.

වැඩසටහන 02

අපේක්ෂිත ඉලක්ක :- ගුණාත්මක වැඩ පරිසරයකින් යුත් පාසලේ කාර්යාලය සකස් කිරිම

යෙදවීම් :- මානව සම්පත, ලිපි ද්‍රව්‍ය, පරිගණක , විදුලි උපකරණ, මේස , පුටු

ක්‍රියාකාරකම් :- ලිපිගොණු පහසුවෙන් හඳුනා ගත හැකි පරිදි ගබඩා කිරීම.

ලිපිගොණු වර්ගීකරණය කර නිලධාරින් ට වගකීම පැවරීම

කාර්යාලයේ සියලු ලිපිගොණු සම්බන්ධයෙන් ලේඛණයක් සකස් කිරීම

නිමැවුම් :- ලිපිගොණු විධිමත්ව සකස් කිරීම.

පහසුවෙන් ලබාගත හැකි,පහසුවෙන් තැබිය හැකි ,පහසුවෙන් නිරික්ෂණය වන ආකාරයට ලිපිගොණු ගබඩා කිරීම

ළඟාකරගත් ඉලක්ක:- එලදායිතාවයෙන් යුතු අලංකාරවත් පාසල් කාර්යාලක් සැකසීම.


05







## 8.12.පාසලට සංවර්ධනයක්

පාසල් සම්මන්ත්‍රණ ශාලාව සඳහා අවශ්‍ය විදුලි පද්ධතිය අක්‍රිය වීම හා පුටු නොමැති වීම නිසා විශේෂ රැස්වීමක් පැවැත්වෙන අවස්ථාවකදී මෙන්ම පාසල තුළ කුමන හෝ රැස්වීමක් පැවැත්වීම සිදුවන අවස්ථාවේදී දරුවන් පංති කාමරය තුළ භාවිත කරනු ලබන පුටු රැස්වීම සඳහා සූදානම් කල යුතු විය. මේ හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා බාධාවන අතර දරුවන් අපහසුතාවයට පත්වීම සිදුවේ.

අපේක්ෂිත ඉලක්ක:- පාසලේ පවතින භිහ සම්පත් සම්පාදනය කරදීම

යෙදවුම් :- ක්‍රීඩා උපකරණ , මිනිස් ශ්‍රමය, ප්‍රධාන ශාලාව සඳහා පුටු, ප්‍රධාන ශාලාවේ විදුලි ආලෝක පද්ධතිය

ක්‍රියාකරකම් :-

- ✓ පාසලේ පවතින භිහ සම්පත් අවශ්‍යතාව හඳුනා ගැනීම
- ✓ අවශ්‍යතාවය වෙනුවෙන් වසමභාර ආර්ථීක සංවර්ධන නිලධාරී විසින් ව්‍යාපෘති යෝජනා ලබාගැනීම
- ✓ ප්‍රාදේශීය සම්බන්ධීකරන කමිටුව වෙත යෝජනාව ඉදිරිපත් කිරීම

නිමැවුම්:- 2024 වර්ෂයේ ක්‍රියාත්මක කරනලද කඳුකර දශක, හා විමධ්‍යගත සංවර්ධන ව්‍යාපෘති අනුමත කර ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම

ළඟාකරගත් ඉලක්ක:- සංවර්ධන ව්‍යාපෘති මඟින් ,

- ✓ රු.500,000.00 ක ප්‍රතිපාදන පාසලේ ප්‍රධාන ශාලාව සඳහා පුටු ,
- ✓ රු.53,000.00 ක ප්‍රතිපාදන ප්‍රධාන ශාලාවේ විදුලි ආලෝක පද්ධතිය අලුත්වැඩියාව
- ✓ රු.500,000.00 ක ප්‍රතිපාදන පාසල් දරුවන් සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබාදීම සිදුවිය












## 8.13.සෙනෙහසේ සත්කාර

**අපේක්ෂිත ඉලක්ක:- සියලු දරුවන්ට පාසල් උපකරණ අවශ්‍යතාවය සපුරාලිම**

**යෙදවුම්:- සපත්තු, පොත් පත් , පාසල් බෑග්, පෑන් , පැන්සල්**

**ක්‍රියාකාරකම් :-**

- **පාසලේ සිටින ආර්ථික අපහසුතා සහිත පාසල් උපකරණ අවශ්‍යතාවය ඇති දරුවන් පාසල මඟින් හඳුනා ගැනිම.**
- **මව විදේශගත , වතු ආශ්‍රිත ආර්ථික ගැටලු සහිත දරුවන් පංති මට්ටමින් හඳුනා ගැනිම.**
- **එක් එක් දරුවන්ට අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය වෙන වෙනම ලයිස්තුගත කිරිම**
- **සම්පත් දායකයන් හා පරිත්‍යාගශීලීන්ගේ සහයෝගය ලබා ගැනිම.**
- **දරුවන් පහසු දිනක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත් කැඳවා උපකරණ ලබාදිම.**

**නිමැවුම්:- පාසලේ පාසල් උපකරණ අවශ්‍ය සියලු දරුවන් සඳහා අධාර ලබාදීම**

**ළඟාකරගත් ඉලක්ක:- සියලු දරුවන්ට සමසේ අධ්‍යාපනය හැදෑරීමේ අවකාශය සැලසීමට හැකිවිම.**









## 08.14 වැඩසටහන

**අපේක්ෂිත ඉලක්ක :-  ආර්ථික අපහසුතා සහිත දරුවන්ට සහයෝගයක් ලබාදීම**

**යෙදවීම් :- කතුරු, පනා, රෙදි**

**ක්‍රියාකාරකම් :- වාර නිවාඩුවෙන් පසු පාසල් ආරම්භක දිනට පෙර දින පාසල් දරුන්ගේ නොමිලේ කොණ්ඩා කැපීම**

**නිමැවුම් :- ආර්ථික දුෂ්කරතා සහිත පවුල්වල දරුවන්ගේ කොණ්ඩා කැපීමට යන පිරිවැය නිදහස් කිරීම.**

**ළඟාකරගත් ඉලක්ක:-  පිරිසිදු, පිළිවෙළට පාසලට පැමිණෙන දරුවන්කු වෙනුවෙන් දායකත්වය සැපයීම.**













## 08.15.සැමට රජයේ විශ්‍රාම වැටුපක්


**අපේක්ෂිත ඉලක්ක:-** සැමට රජයේ විශ්‍රාම වැටුපක් හිමි කර දීම


**යෙදවීම්:-** මානව සම්පත, ලිපි ද්‍රව්‍ය, පරිගණක , විදුලි උපකරණ, මේස , පුටු ,අත් පත්‍රිකා ,පෝස්ටර්

**ක්‍රියාකාරකම් :-** සැමට විශ්‍රාම වැටුපක් තේමාව කොට ගෙන සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ දැනුවත් කිරීම සහ නව දායකයින් බඳවා ගැනීම

**නිමැවුම්:-** දැනුවත් කිරීමේදි සමාජ ආරක්ෂණ ක්‍රමයට දායකයින් බඳවා ගැනීම

**ළඟාකරගත් ඉලක්ක:-** සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ දැනුවත් කර වැඩි පිරිසක් විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක කර ගැනීම





## 09. මූල්‍ය සම්පත් හා අවශ්‍ය වෙනත් සම්පත් සපයාගත් ආකාරය:-

- වසම වෙනුවෙන් ලබාගන්නා ලද සංවර්ධන ව්‍යාපෘති මඟින්
- ප්‍රදේශයේ සම්පත් දායකයන්ගේ පරිත්‍යාග මඟින්
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල ළමා ඒකකයේ සම්පත් සංචිතයේ පරිත්‍යාග මඟින්
- වැඩසටහන සඳහා සම්බන්ධ වූ නිලධාරීන් අයත් අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු ප්‍රතිපාදන
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන්ගේ පරිත්‍යා මඟින්
- දකුණු පළාත් ආයුර්වේද දෙපාර්තුමේන්තුව දායකත්වයෙන් ඔසු පැළ ලබා දීම.
- මාදුගැට විදුලිබලාගාරයේ දායකත්වයෙන් පළතුරු පැළ ලබා දිම.

## 10.පසු විපරම් ක්‍රමවේදය

- ❖ ක්‍රියාත්මක කරන වැඩසටහන් වල ප්‍රගතිය ඒ ඒ වැඩසටහන් සිදුකරන නිලධාරියා විසින් ඊට අදාළ නිර්ණායක තුළින් ලබා ගැනීම.
- ❖ පාසල අයත් වසමේ ග්‍රාම නිලධාරී, ආර්ථික සංවර්ධන නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම සංවර්ධන නිලධාරී මඟින් අධීක්ෂණ කටයුතු සිදු කිරීම
- ❖ පාසලේ දරුවන් පංති වශයෙන් කණ්ඩායම්කර වැඩසටහන් ඉදිරියට පවත්වාගෙනයාම සඳහා නායකයන් පත්කිරීම.
- ❖ එක් එක් විෂය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් හා පාසලේ එක් ගුරුවරයකු බැගින් පත්කර වැඩසටහන යාවත්කාලීන කිරීම.(උදා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කෘෂිකර්ම නිලධාරි හා පාසලේ කෘෂිකර්ම විෂය භාර ආචාර්යවරයා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මනෝ උපදේශන නිලධාරි හා පාසලේ මනෝ උපදේශන විෂය භාර ආචාර්යවරයා,)
- ❖ සෑම මසකම නිලධාරීන්ගේ වැඩසටහන් ප්රගතිය ලබා ගැනිම හා ඒවායේ අඩුපාඩු සාකච්ඡා කිරීම.(ස.අ/ස.ප්රා.ලේ/ ප්රා.ලේ විසින් සාකච්ඡා කිරීම.

## 11.ඇමුණුම්

1. ඕපාත මහා විද්‍යාලයේ විදුහල්පතිතුමාගේ ලිපිය
2. වැඩසටහන් වලට අදාළ අත්සන් ලේඛන
   *ඡායාරූප , ඇමුණුම්,යටතේ ඉදිරිපත් කර නොමැති අතර වැඩ සටහන් විස්තරය තුල ඇතුළත් කර ඇත.

**සකස් කළේ ................**

එස්.එස් ධනුෂ්කා

ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-තවලම

**පරික්ෂා කළේ...................**

ඒ.එන්.මහලියන

සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-තවලම

**අනුමත කරමි.**

.....................................

**නිලූකා.එල්.සූරියආරච්චි**
**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**
**තවලම.**